# අළු බදාදා

## පළමුවන දේව ප්‍රකාශනය ජෝවෙල් 2: 12–18

*ජෝවෙල් දිවැසිවරයාගේ පොතෙන් උපටා ගත් කොටසකි.*

වත ඉරාගෙන නොව සිත ඉරාගෙන
තුමේ දෙවි සමිඳුන් වෙත හැරී එන්න.

සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක: "උපවාසයෙන් ද වැළපීමෙන් ද මුළු සිතින් දැන් වත් මා වෙත හැරී එන්න. වත ඉරාගෙන නොව, සිත ඉරාගෙන, තුමේ දෙවි සමිඳුන් වෙත හැරී එන්න. මන්ද, එතුමාණෝ, කරුණාභරිත, දයාන්විත, වහා නොකිපෙන, තිර පෙමින් සමන්විත, කමා වීමට කැමති දෙවි කෙනෙකි. සමහර විට එතුමාණන් සිය සිත වෙනස් කරගෙන කමා වී අපට ආශීර්වාද කිරීම නිසා, ආහාර පූජා ද පානීය පූජා ද ඔබේ දෙවි සමිඳුන්ට ඔප්පු කරන්නට හැකි වනු ඇද්දැයි කවරෙක් දනිත් ද? සියොන් කන්දේ හොරණෑව පිඹින්න: උපවාසයක් පනවා, අයැදුමට සෙනග රැස් කරන්න: සෙනග එක්රැස් කරන්න. ශුද්ධ සභාවට ඔවුන් සූදානම් කරන්න. ප්‍රජා මූලිකයන් එකතු කරන්න: ළමයින් ද කිරි දරුවන් ද ගෙන එන්න: මනාළයා තම යහන් ගබඩාවෙන් ද මනාලිය තම නිදන කුටියෙන් ද පිටත එත් වා! ද්වාර මණ්ඩපය හා පූජාසනය අතර සිටින සමිඳුන්ගේ සේවක පූජකයෝ හඬා වැළපෙමින්, 'සමිඳුනි, ඔබේ සෙනගට අනුකම්පා කළ මැනව, ඔබේ දෙවියෝ කොයි දැ යි ජාතීන් අතරේ කීමට ඉඩ නොහැරිය මැනවැ'යි කියත් වා!" එවිට සමිඳාණන් වහන්සේ දේශය ගැන උද්යෝගවත් වී සෙනගට අනුකම්පා කළ සේක.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය

ගීතාවලිය 51: 1–4, 10–13, 15

පිළිතුර : දෙවිඳුනි, ඔබේ දයා කරුණාවෙන් මට අනුකම්පා කළ මැනව.

ගීය : දෙවිඳුනි, ඔබේ දයා කරුණාවෙන් මට අනුකම්පා කළ මැනව:
ඔබේ විපුල දයාවෙන් මාගේ අපරාධ මකාදැමුව මැනව.
මාගේ කෙලෙස් මලින් මා මුළුමනින් සෝදාලුව මැනව:
මාගේ පාප මලින් මා පිවිතුරු කළ මැනව.

මාගේ අපරාධ මම මැනවින් දනිමි.
දිවා රෑ දෙක්හි මාගේ පාප මට සිහි වේ.
ඔබට විරුද්ධ ව, ඔබට පමණක් විරුද්ධ ව මම පව් කෙළෙමි:
ඔබ හමුවෙහි මම නපුර කෙළෙමි.
එබැවින් ඔබේ තීන්දුව සාධාරණ ය:
ඔබේ විනිශ්චය යුක්ති සහගත ය.

දෙවිඳුනි, මා තුළ නිර්මල සිතක් මවා වදාළ මැනව.
නිරසර නව ආධ්‍යාත්මයක් මට දුන මැනව.
ඔබ හමුයෙන් මා පළවා නොහැරිය මැනව:
ඔබේ ශුද්ධාත්මය මා කෙරෙන් ඉවත් නොකළ මැනව.

විමුක්තියේ ප්‍රීතිය මට යළි දුන මැනව:
අවනත සිතක් දී මා දැරුව මැනව.
එවිට මම අපරාධකරුවන්ට ඔබ මග පහදා දෙන්නෙමි:
පව්කරුවන් ඔබ වෙත හරවාගෙන එන්නෙමි.
සමිඳුනි, ගී ගැයුමේ වරම මට දුන මැනව.
එවිට මා මුවින් ඔබ පැසසුම් ගයන්නෙමි.

## දෙවන දේව ප්‍රකාශනය 2 කොරින්ති 5: 20 – 6: 2

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද දෙවන හසුනෙන් උපුටා ගත් කොටසකි.*

**මෙය ප්‍රසාදජනක කාලයයි. සමිඳුන් වෙත හැරී එන්න.**

දෙවියන් වහන්සේ ම අප මගින් ඔබ හට ආයාචනා කරන්නාක් මෙන්, අපි ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් තානාපතියන් වී, දෙවියන් වහන්සේ හා සමගි වන ලෙස, ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් ඔබට ආයාචනා කරමු. දෙවියන් වහන්සේ, පාපය නොදත් ක්‍රිස්තුන් වහන්සේ, අප උදෙසා මනුෂ්‍ය පාපී බව හා සම වීමට සැලසූ සේක. එසේ කළේ ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගෙන දෙවියන් වහන්සේගේ ධර්මිෂ්ඨකමට අප පංගුකාර වනු පිණිස ය. එබැවින්, දේව සේවයේ පංගුකාරයන් වශයෙන් ඔබ ලබා ඇති දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය අපතේ නොහරින ලෙස අපි ඉල්ලා සිටිමු. මන්ද, “ප්‍රසාදජනක කාලයේ දී මම ඔබට සවන් දුනිමි, ගැලවීමේ දවසේ දී මම ඔබට පිහිට වූණෙමි”යි දෙවියන් වහන්සේ වදාරන සේක. මෙය ප්‍රසාදජනක කාලය යි. මෙය ගැලවීමේ දවස යි.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද ගීතාවලිය 51: 10, 12

දෙවිඳුනි, මා තුළ නිර්මල සිතක් මවා වදාළ මැනව:
විමුක්තියේ ප්‍රීතිය මට යළි දුන මැනව.

## සුවිශේෂය මතෙව් 6: 1–6, 16–18

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

**රහසින් කරන දේ දකින ඔබේ පියාණන් වහන්සේ ඔබට පල විපාක දෙන සේක.**

“මිනිසුන්ට පෙනෙන පිණිස ලෝකයා ඉදිරියෙහි ඔබේ පුණ්‍ය ක්‍රියා නොකරන්න බලා ගන්න. එසේ කළහොත්, ස්වර්ගයෙහි වැඩ වසන ඔබේ පියාණන්

වහන්සේගෙන් කිසි විපාකයක් ඔබට නොලැබෙන්නේ ය. එබැවින් ඔබ දන් දෙන කල, මිනිසුන්ගෙන් ප්‍රශංසා ලබන පිණිස ධර්ම ශාලාවල දී ත්, වීථිවල දී ත් කෛරාටිකයන් කරන්නාක් මෙන් ඔබට පෙරටුවෙන් හොරණෑ නොපිඹින්න. සැබැවින් ම, මම ඔබට කියමි, ඔවුන්ගේ විපාකය ඔවුන්ට දැනට ම ලැබී ඇත. එහෙත්, ඔබ දන් දෙන කල, දකුණත කරන දෙය වමතට නොදැනේ වා. ඒ දන් දීම රහසක් ව තිබිය යුතු ය. එවිට රහසින් එය දකින ඔබේ පියාණන් වහන්සේ ඔබට පල විපාක දෙන සේක.

ඔබ යාච්ඤා කරන කල කෛරාටිකයන් කරන්නාක් මෙන් නොකරන්න. මිනිසුන්ට පෙනෙන පිණිස ඔව්හු ධර්මශාලාවලත්, මංසන්ධිවලත් සිටගෙන යාච්ඤා කිරීමට ප්‍රිය වෙති. සැබැවින් ම මම ඔබට කියමි, ඔවුන්ගේ විපාකය දැනට ම ඔවුන්ට ලැබී ඇත.

එහෙත් ඔබ යාච්ඤා කරන කල ඔබේ ම ඇතුළු කාමරයට වැද, දොර වසාගෙන, අදෘශ්‍යමානව වසන ඔබේ පියාණන් වහන්සේට යාච්ඤා කරන්න. එවිට රහසින් ඔබ කරන දේ දකින ඔබේ පියාණන් වහන්සේ ඔබට පල විපාක දෙන සේක.

ඔබ උපවාස කරන කල කෛරාටිකයන් මෙන් දොම්නස් මුහුණු ඇති ව නොසිටින්න. තමන් උපවාස කරන බව මිනිසුන්ට පෙනෙන පිණිස ඔව්හු මුහුණු විරූප කර ගනිති. සැබැවින් ම මම ඔබට කියමි: ඔවුන්ගේ පල විපාක දැනට ම ඔවුන්ට ලැබී ඇත. එහෙත් ඔබ උපවාස කරන කල, හිස තෙල් ගල්වා, මුහුණ සෝදාගන්න. මෙසේ අදෘශ්‍යමානව වසන ඔබේ පියාණන් වහන්සේට මිස, ඔබ උපවාස කරන බව මිනිසුන්ට නොපෙනෙයි. එවිට රහසින් කරන දේ දකින ඔබේ පියාණන් වහන්සේ ඔබට පල විපාක දෙන සේක."

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*